*සියලුම හිමිකම් ඇවිරිණි.*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

**08 ශ්‍රේණිය**

# චිත්‍ර කලාව

**කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01 ඉහත රූපයෙන් දැක්වෙන්නේ ........................................................................................... බුද්ධ ප්‍රතිමාවයි.

02 මෙම ප්‍රතිමාවේ ශිල්ප ක්‍රමය ........................................................................... නෙළීමේ ශිල්ප ක්‍රමයයි.

03 ප්‍රතිමාවේ වම් අතින් .................................................................................. මුද්‍රාව නිරූපිත ය.

04 මෙහි දකුණතින් නිරූපිත මුද්‍රාව අභය හෙවත් ........................................................... මුද්‍රාව ලෙස හඳුන්වයි.

05 මෙම ප්‍රතිමාව පිහිටුවා ඇති ආසනය (පීඨිකාව) .......................................................... ලෙස හඳුන්වයි.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

06 උඩරට නර්තන සම්ප්‍රදාය සමඟ බැඳුණු ශාන්ති කර්මයක් නම් කරන්න ...........................................................

07 අරිම්බුව කුන්දිරක්කන් හා පනාව යන සැරසිලි මෝස්තර අයත් වන සැරසිලි ඒකක ගණය කුමක් ද?
...................................................................................................

08 ඉන්දියාවේ බුදු පිළිම අතරින් (ඉඳි පිළිම) වල බහුල වශයෙන් යොදාගෙන ඇති ආසන ක්‍රමය කුමක් ද?

.....................................................................................................

09 පිත්තල කර්මාන්තයේ දී සෙම්බු, කොතල, කෙණ්ඩිය ආදී භාණ්ඩ නිර්මාණය සඳහා යොදා ගනු ලබන ශිල්ප ක්‍රමය කුමක් ද? ........................................................................................................................

10 ද්විතීයික වර්ණයක් වන දම් වර්ණයෙන් නිල් වර්ණය ඉවත් කළ විට ඉතිරි වන අනෙක් වර්ණය කුමක් ද?
...................................................................



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 රූකඩ නිර්මාණය සඳහා වැඩි වශයෙන් භාවිතා කරන දැව වර්ගයක් වන්නේ,

(1) කදුරු (2) ලුණු මිදෙල්ල (3) මැහෝගනී (4) හල්මිල්ල

12 පන් හා නියඳ වර්ණ ගැන්වීමේ දී රතු වර්ණය සාදා ගැනීම සඳහා යොදා ගත් අමු ද්‍රව්‍යයක් වන්නේ,

(1) රසකිඳ (2) පතඟි දැව (3) අරළු (4) බුළු

13 ථූපාරාම ස්තූපය ඉදිකල කාලය (සියවස) කුමක් ද?

(1) ක්‍රි. ව. 03 සියවස (2) ක්‍රි. ව. 04 සියවස (3) ක්‍රි. පූ. 03 සියවස (4) ක්‍රි. ව. 02 සියවස

14 හින්දු ආගමේ ආගමික සංකේතය ලෙස භාවිත කරන්නේ,

(1) නන්දි ගවයා (2) ත්‍රිශූලය (3) ශිවලිංගය (4) වෘෂභ කොඩිය

15 පාරම්පරික මැටි කලා කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය කරනු ලබන ගෘහාසක්ත භාණ්ඩය කුමක් ද?

(1) කොතලය (2) ඌරා කැට ළින්

(3) කොත් කැරළි (4) ගිනි කබල

- **අංක 16 සිට 20 තෙක් දී ඇති රූපවලට වඩාත් සෘජු සබඳතාවක් දක්වන රූපය ඉදිරියෙන් ඇති A B C D E යන රූප අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 16 |  | (....................) |  | A |
| 17 |  | (....................) |  | B |
| 18 |  | (....................) |  | C |
| 19 |  | (....................) |  | D |
| 20 |  | (....................) |  | E |

- අංක 21 සිට 25 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

21 සන්නිදර්ශන චිත්‍ර - ..........

22 යාග සාලෙයි - ..........

23 ඇල්ටමීරා - ..........

24 අල්තාරය - ..........

25 වක දෙක - ..........

- පහත දැක්වෙන කලා නිර්මාණය හඳුනාගෙන ඒ පිළිබඳව අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න.



26 ..........

27 ..........

28 ..........

29 ..........

30 ..........

## III කොටස

- **ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.**
- **පහත දැක්වෙන මාතෘකා අතරින් කැමති එක් මාතෘකාවක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.**

01 ආගමික උත්සවයක බැතිබර මොහොතක්

02 අස්වනු නෙළන ගොවි ගෙවිලියන්

03 ඇලක, ගඟක, දිය නාන මිතුරන්

04 ළමා ගීතයකට හෝ ළමා කතාන්දරයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක්

05 කුෂන් කවරයක් සඳහා සුදුසු මුළුතල මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න. අඟල් "6 x 6" ප්‍රමාණය යොදා ගන්න.

06 මලක් සහ කොළයක් යොදාගෙන ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | අවුකන | 02 | පූර්ණ උන්නත / අධි උන්න. | 03 | කටක හස්තය | 04 | ආශිර්වාද / ආශිව | | | | | | |
| 05 | පද්මාසන | 06 | කොහොඹා කංකාරිය | 07 | නිර්ජීව් | 08 | පද්මාසන ක්‍රමය | | | | | | |
| 09 | ඉටි වාත්තු ක්‍රමය | 10 | රතු | 11 | 1 | 12 | 2 | 13 | 3 | 14 | 4 | 15 | 2 |
| 16 | D | 17 | A | 18 | E | 19 | B | 20 | C | | | | |

21 ගද්‍ය හෝ පද්‍ය කොටසක අර්ථය මතු කිරීම සඳහා අඳින ලද සිතුවම් ය.

22 කුම්බාබිෂේකම් ශාන්ති කර්මයේ දක්නට ලැබෙන සැරසිලි අංගයකි

23 ස්පාඤ්ඤයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථානයකි.

24 කිතු දේවස්ථානයක දිග් ශාලාවේ එක් කොනක අලංකාර වැටක් සහිතව නිමකොට ඇති පූජාසනයයි.

25 සිංහල සැරසිලි කලාවේ මූලික අභ්‍යාසයකි.

26 පහන් මඩු ශාන්ති කර්මයේ දක්නට ලැබෙන සැරසිලි අංගයකි. (සබරගමු නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්ති කර්මයට අයත් සැරසිල්ලකි)

27 මෙම සැරසිලි අංගය මඩුව සැරසීම ලෙස හඳුන්වයි.

28 මේ සඳහා සරල සාම්ප්‍රදායික සැරසිලි ක්‍රම භාවිතා වේ.

29 සැරසිලි අමුද්‍රව්‍ය ලෙස ගොප් කොළ හබරල කොළ වැනි ද්‍රව්‍ය බහුල ව භාවිතයට ගැනෙයි.

30 මඩුව සැරසිලි කිරීමේ දී තැඹිලි, පොල්, ආදී වලු වර්ග භාවිතා කෙරේ.

(26 - 30 දක්වා පිළිතුරු වෙනත් අයුරකින් අර්ථවත්ව සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න)